# සාමාන්‍ය සමය තිස්එක්වන සතිය

## සඳුදා

පළමුවන කියැවීම රෝම 11: 29–36

ශුද්ධ වූ පාවුළු තුමන් විසින් රෝමවරුන් වෙත යවන ලද හසුනෙන් කොටසකි.

සියල්ලන් වෙත දයා කරුණාව පෙන්වන පිණිස දෙවියන් වහන්සේ සියල්ලන්
අකීකරු කමෙහි පැවතීමට ඉඩ හැරි සේක.

දෙවියන් වහන්සේ සිය දීමනා ද කැඳවීම ද වෙනස් නොකරන සේක. විජාතීන් වන ඔබ යටගිය දවස දෙවියන් වහන්සේට අකීකරුව සිටි නමුත්, ජුදෙව්වරුන්ගේ අකීකරුකම නිසා දැන් ඔබ කරුණාව ලබා ඇත. එසේම ඔවුන් දැන් අකීකරුව සිටින්නේ, ඔබට දක්වන ලද කරුණාව නිසා ඔවුනුත් කරුණාව ලබන පිණිස ය. මන්ද, දෙවියන් වහන්සේ සකල සත්ත්වයන්ට කරුණාව දක්වන පිණිස සකල සත්ත්වයන් අකීකරුකම නමැති බන්ධනාගාරයෙහි තැබූ සේක.

දෙවියන් වහන්සේගේ වරප්‍රසාද සම්භාරය කෙතරම් විශාල ද? උන්වහන්සේගේ ප්‍රඥාව සහ ඥානය කෙතරම් ගැඹුරු ද? උන්වහන්සේගේ විනිශ්චයන් කෙතරම් අචින්ත්‍ය ද? උන්වහන්සේගේ ක්‍රියා මාර්ග කෙතරම් වර්ණනා විෂයාතික්‍රාන්ති ද? ශුද්ධ ලියවිල්ලෙහි මෙසේ කියා ඇත.

“ස්වාමින් වහන්සේගේ සිත තේරුම් ගත්තේ කවරෙක් ද? උන්වහන්සේට පුරෝහිතයා වූයේ කවරෙක් ද? උන්වහන්සේගෙන් ප්‍රතිඵලයක් ලබනු පිණිස, පළමු කොට උන්වහන්සේට යමක් දුන්නේ කවරෙක් ද?”

මන්ද, සියල්ල මවා වදාරන්නේ උන්වහන්සේ ය. සියල්ල රක්ෂා කරන්නේ, සියල්ල අර්ථාන්විත කරන්නේ උන්වහන්සේ ය. උන්වහන්සේට සදහටම මහිමය වේවා! ආමෙන්.

දේව වචනය මෙසේ ය.

පිළිතුරු ගීය ගීතාවලිය 69: 29–30, 32–33, 35–36

පිළිතුර : අහෝ දෙවිඳුනි, ඔබේ අධික ප්‍රේමයෙන් අපට පිළිතුරු දුන මැනව.

ගීය :
එහෙත්, මම පීඩා විඳිමින් වේදනාවෙන් සිටිමි.
අනේ දෙවිඳුනි, මා සනසා, මා ගළවා ගත මැනව.
එවිට මම ගී ගයා දෙවිඳුන් පසසන්නෙමි.
තුති ගී ගයමින් මම එතුමන් බොහෝ සේ පසසන්නෙමි.

පීඩිතයෝ මෙය දැක ප්‍රීති ප්‍රමෝද වන්නෝ ය.
දෙවිඳුන් සොයා යන්නෝ දිරිමත් වන්නෝය.
මන්ද, සමිඳාණෝ දිළිඳුන් හට සවන් දෙන සේක.
සිරගත වී සිටින තම සෙනග අත් නොහරින සේක.

දෙවිඳාණෝ සියොන් කන්ද මුදාගෙන ජුදාගේ නගර ගොඩනගන සේක.
එතුමන් සෙනඟ එහි වසමින් එය භුක්ති විඳින්නෝ ය.
එතුමන්ගේ සේවක පෙළපත එය උරුම කර ගන්නෝ ය.
දෙව් නමට පෙම් කරන්නෝ එහි වාසය කරන්නෝ ය.

සුපුවත් ජය නද ගීතාවලිය 119: 18

ආලේලූයා! ආලේලූයා!
අහෝ සමිඳුනි, ඔබේ ව්‍යවස්ථාවෙහි පුදුම අගයන් දක්නා පිණිස,
අපගේ ඇස් පැහැදුව මැනව.
ආලේලූයා!

නොහොත්

සුපුවත් ජය නද ජුවාම් 8: 31-32

ආලේලූයා! ආලේලූයා!
"ඔබ මාගේ ධර්මයෙහි පිහිටා පවතින්නහු නම්,
ඔබ මාගේ ගෝලයෝ ය. ඔබ මාගේ සත්‍යය අවබෝධ කරගන්නහු ය" යි
සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

සුවිශේෂය ලූක් 14: 12-14

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

"ඔබ මිතුරන් නොව, දිළිඳුන් හා අබ්බගාතයන් කැඳවන්න."

ජේසුස් වහන්සේ තමන්ට ආරාධනා කළ තැනැත්තාට කතා කොට, "ඔබ රෑ කෑමක් හෝ දවල් කෑමක් හෝ පිළියෙළ කරන කල, ඔබේ මිතුරන්, සහෝදරයන්, නෑයන් හෝ පොහොසත් අසල්වාසීන් හෝ නොකැඳවන්න. එසේ කළොත් ඔවුන් ද එසේම ඔබත් කැඳවනු ඇත. එයින් ඔබට එහි විපාකය ලැබෙයි. එහෙත් ඔබ භෝජන සංග්‍රහයක් පිළියෙළ කරන කල, දිළිඳුන් ද, අබ්බගාතයන් ද, කොරුන් ද, අන්ධයන් ද කැඳවන්න. ඔබට ප්‍රතිවිපාකයක් දෙන්නට ඔවුන්ට නොහැකි බැවින් ඔබ භාග්‍යවන්ත වන්නෙහි ය. ධර්මිෂ්ඨයන්ගේ පුනරුජ්ජීවනයේ දී ඔබට ප්‍රතිවිපාකයක් ලැබෙන්නේ ය" යි වදාළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.